# වත්තක්ඛන්ධකයෙහි නිර්දේශිත ආරාමික වත්පිළිවෙත් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කොටියාගල උපරතන හිමි

A Buddhist monk is a great character who wishes the benefit not only his but also others. The main objective of his life is to achieve into the *Nibbāna* eradicating all sufferings (*Sabba dukkha nissaraṇa nibbāna sacchikaraṇatthāya*). In order that, the main purpose of a monk is seemed as realizing the *Nibbāna* (emancipation) and it is not an egoistic intention. However, at first, it is necessary to be realized the truth or *Nibbāna* by him and then he can distribute the dhamma for the well-being of others. It is very famous that there are many obstacles in the household life (*sambādhoyaṃ garāvāso*). Hence, the individual who understood this situation of the lay life enters into the Buddhist order in order to realize the truth. It should also remember here that not only today even in the Buddha's time, there were some bhikkhus who tried to be egoistic. Further, it should also be noted that some monks, at present, who have entered into the Buddhist order are doing various unrighteous deeds. when comparing this with the Buddha's time, the issue has been more increased. Therefore, this paper is to examine An Inquiry into the Utilization of the Religious Practices Recommended by the Culavaggapali Estate.

## හැඳින්වීම

ආත්මාර්ථ සාධනයට වඩා පරාර්ථ සාධනය උදෙසා සිය ජීවිතය කැප කොට පරාර්ථ හා ආත්මාර්ථ සාධනය ඒකාබද්ධ ව ඉෂ්ට වීමේදී තෘප්තිමත් වන සමූහයකි,

පරමාදර්ශී බෞද්ධ භික්ෂු සමාජය. බෞද්ධ භික්ෂු ජීවිතයේ අරමුණ වන්නේ ,සියලු දුක් නැති කොට නිර්වාණාවබෝධය පසක් කිරීමයි., (සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය) සත්වග වෙසෙනා සියලු සතුන් හා තමා සංසාර දුක්ඛයෙන් එතෙර ව නිර්වාණය පසක් කරලීම භික්ෂුවගේ ඒකායන අරමුණ විය යුතුය. එය හුදෙක් ආත්මාර්ථකාමී ක්‍රියාවලියක් නොවිය යුතුය. කෙසේ වෙතත් පළමු ව තමා ධර්මාවබෝධය ලබා ගන්නා අතර අන්‍යයා ද ඒ තුළින් විමුක්ති සාධනය කරවීම භික්ෂුවගේ ආකල්පයයි. සම්බාධ සහිත වූ කෙලෙස් බරිත වූ ගිහි ජීවිතය හැර පියා උතුම් පැවිද්ද නිදහස් යැයි සලකා පුද්ගලයා භික්ෂුත්වයට පත් වන්නේ සංසාර දුකින් එතෙර ව නිර්වාණය පසක් කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගනු පිණිස ය. භික්ෂුත්වයෙහි ඒකායන පරමාර්ථය පසෙකලා ආත්මාර්ථ ශුභ සිද්ධිය උදෙසා බුද්ධ කාලයෙහි සිට ම ඇතැම් පුද්ගලයන් ප්‍රවිෂ්ට වූ බවක් පෙනෙයි. සිය කෙටි පරමාර්ථ සාධනය උදෙසා ඇතැම් පුද්ගලයන් භික්ෂුත්‍වයට ප්‍රවිෂ්ට වී විවිධ අසාර වූ කාර්යයන් කෙරෙහි යොමු වෙයි. බුද්ධ කාලයෙහි මෙන් ම වර්තමානයෙහි ද මෙම සන්සිද්ධිය බහුල ව සිදු වෙයි. එහෙයින් නූතන භික්ෂු සමාජයේ යහපැවැත්ම උදෙසා චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි නිර්දේශිත ආරාමික වත්පිළිවෙත්හි උපයෝගිතාව පිළිබඳ තොරතුරු විමර්ශනය කිරීම මෙහිදී සිදු වෙයි.

**පර්යේෂණ ගැටලුව**

පුරාතන භික්ෂු සමාජයෙහි යහ පැවැත්ම උදෙසා බුදුන් වහන්සේ නිර්දේශිත ආරාමික වත්පිළිවෙත්හි ප්‍රායෝගික උපයෝගිතාවක් නූතන භික්ෂු සමාජයේ යහපැවැත්මෙහි ලා යොදා ගත හැක්කේ ද යන්න විමර්ශනය කිරීම මෙහි පර්යේෂණ ගැටලුව වේ.

**පර්යේෂණයේ අරමුණ**

බුද්ධධරමාන සමයේ සිට වර්තමානය දක්වා වූ බෞද්ධ භික්ෂුවගේ දිවි පැවැත්මෙහි හා චර්යා රටාවෙහි යම් වෙනසක් තිබඳව ම දැකිය හැකි වේ. බෞද්ධ භික්ෂුවගේ ජීවන රටාවෙහි යහපැවැත්ම උදෙසා යම් රීති පද්ධතියක් විනය පිටකානුගත ව බුදුන් වහන්සේ නිර්දේශ කළහ. චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි නිර්දේශිත ආරාමික වත්පිළිවෙත් නූතන භික්ෂු සමාජයෙහි යහපැවැත්ම උදෙසා උපයෝගි වන ආකාරය මූලාශ්‍රයාශ්‍රයෙන් විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙහි අරමුණ යි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණයෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයික මූලාශ්‍රය හා අනෙකුත් මූලාශ්‍රය අධ්‍යයනය කිරීමත් සිදු කෙරෙයි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

**බෞද්ධ භික්ෂු සමාජය**

ගිහි ජීවිතයෙහි අනේකවිධ දුක්ඛදෝමනස්සයන් වූ පළිබෝධයන් නිසාවෙන් ම සසර ගමනෙහි විනිර්මුක්තිය වූ නිර්වාණය සාක්ෂාත්කරණය උදෙසා විවිධ

පුද්ගලයෝ බුදුන් වහන්සේගේ සංඝ සමාජයෙහි ප්‍රව්‍රජාව ලැබූහ. සුවිශේෂ පරමාර්ථ හා ප්‍රතිපත්තිවලින් හෙබි බුද්ධධරමාන සමයෙහි වූ භික්ෂු සමාජය පරමාදර්ශී විය. ස්වාර්ථය පසෙක ලා පරාර්ථය වෙනුවෙන් ද පෞද්ගලිකත්වය හැරදමා සාමූහිකත්වය ම අගයමින් සාමූහිකත්වයෙන් ක්‍රියාකරන නිසාවෙන් ම එවක භික්ෂු සමාජය "සංඝ" යන නාමයෙන් හඳුන්වන ලදි. බුදුන් වහන්සේ සිය ශ්‍රාවකයන් හඳුන්වන ලද්දේ ''භික්ඛු'' යන ව්‍යවහාරයෙනි. එහෙයින් භික්ෂු සමාජය "භික්ඛු සංඝ" නමින් හැඳින්විණි. සංඝ යන නාමයෙන් සමකාලීන ආගමික ශ්‍රමණයන් ද හඳුන්වා ඇති බව පෙනේ.[1] තත්කාලීන ශ්‍රමණ ශ්‍රාවකයන් අතුරෙන් බෞද්ධ භික්ඛු සංඝ හෙවත් බෞද්ධ භික්ෂු සමාජය සුවිශේෂී වන්නේ සසර බිය දකිමින් පිණ්ඩපාත ආහාරයෙන් යැපෙමින් සිඳුණු බිඳුණු වස්ත්‍ර දරමින් නිර්වාණාවබෝධය ම ඒකායන අරමුණ කරගනිමින් වෙසෙන නිසාවෙනි (ඡින්නභින්න පටධරොතීති භික්ඛු). මෙම ආර්ය ශ්‍රාවක වූ භික්ෂු සමාජය හෙවත් සංඝ සමාජය බෞද්ධ භික්ෂු සමාජය නම් වන අතර එය පස්වග මහණුන් ප්‍රව්‍රජ්‍යාත්වයට පත් වීමෙන් ආරම්භ විය.[2] බුදුන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වන ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව බරණැස ඉසිපතන මිගදායෙහි දී පවත්වන අතර එය ශ්‍රවණය කිරීමෙන් පස්වග තවුසන් අතුරෙන් කොණ්ඩඤ්ඤ තවුසා පැවිද්ද හා උපසම්පදාව ඉල්ලීය.[3] පැවිද්ද හා උපසම්පදාව එකවර ලබාදුන් බුදුන්වහන්සේ ශ්‍රී සද්ධර්මය අවබෝධ කරගත් කොණ්ඩඤ්ඤ තවුසා "අඤ්ඤාකොණ්ඩඤ්ඤ" නම් වූ විශේෂ නාමයෙන් හැඳින්වූහ.[4] එහෙයින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ බුදුන් වහන්සේගේ ශාසනයෙහි ප්‍රථම පැවිදි භික්ෂුව, ප්‍රථම උපසම්පදා භික්ෂුව, ප්‍රථම රහතන් වහන්සේ, ප්‍රථම ශ්‍රාවකයා ආදි වූ වශයෙන් සම්බුද්ධ ශාසනයෙහි ප්‍රථම භාරකාරිත්වය ලැබූ රහතන් වහන්සේ වශයෙන් හැඳින්වූහ. අනතුරු ව වප්ප,භද්දිය,මහානාම හා අස්සජි යන තවුසන් සිව් දෙනා ද ධර්මාවබෝධය ලබා පිළිවෙළින් පැවිද්ද හා උපසම්පදාව ලැබූහ.[5] බුදුන් වහන්සේ දේශිත අනත්ත ලක්ඛණ සූත්‍රය ශ්‍රවණය කර රහත් ඵලය ලබා ගත්හ.[6] බෞද්ධ භික්ෂු සමාජයේ ආරම්භය සනිටුහන් වන්නේ මෙම ප්‍රථම රහත් පස් නමගෙන් ය.

පස්වග තවුසන්ගේ පැවිදි උපසම්පදාවෙන් ආරම්භ වූ භික්ෂු ශාසනය යසකුල පුත්‍රයා හා ඔහුගේ යහළුවන් පනස් හතර දෙනා භික්ෂු ශාසනයට ඇතුළත් කොට පැවිද්ද හා උපසම්පදාව ලබා දීමෙන් හා අරහත්වයට පත් වීමෙන් භික්ෂු ශාසනයෙහි රහතන් වහන්සේලා සැට නමක් බවට පත්වූහ. බුදුරජාණන් වහන්සේ මෙම ප්‍රථම භික්ෂු රහත් හැටනම උදෙසා බොහෝ දෙව් මිනිසුන්ගේ හිතසුව පිණිස ලෝකාර්ථ චර්යාව උදෙසා යහපත පිණිස මුල මැද අග යහපත් වූ අර්ථ සහිත ව්‍යඤ්ජන සහිත අතිශයින් පාරිශුද්ධ වූ ශ්‍රී සද්ධර්මය එක මඟ දෙනමක් නොගොස් දේශනා කරන ලෙස දැනුවත් කළහ.[7] ප්‍රථම රහත් හැටනම මෙම අවවාදය අනුව යමින් ඒ ඒ දිශාවන්හි ජනපදයන්හි පරාර්ථ සාධනය උදෙසා ධර්ම ප්‍රචාර කටයුතු කළ අතර එම නිරවද්‍ය විමුක්ති මාර්ගය අවබෝධ කරගත් බොහෝ දෙනා පැවිදි-උපසම්පදාව ලබාගැනීමේ අරමුණෙන් බුදුන් වහන්සේ වෙත පැමිණිය හ.[8] සිය ශ්‍රාවක පිරිස් පැවිද්ද-උපසම්පදාව ලබාගැනීමේ අටියෙන් තමා වෙත පැමිණීමේ දුෂ්කරතාව අවබෝධ කරගත් බුදුන් වහන්සේ ඒ ඒ දිශාවන්හි ප්‍රදේශයන්හි පැවිද්ද හා උපසම්පදාව ලබා දීමේ අවසරය

මහරහත් වහන්සේලා වෙත පැවරූහ.[9] පැවිද්ද හා උපසම්පදාව ලබා දීමේ ක්‍රමවේදය හා පිළිවෙළ මහතෙරවරුන් වෙත පැවරූ බුදුන්වහන්සේ (තිසි) සරණාගමන පබ්බජ්ජා, සරණාගමන උපසම්පදා ආදි ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කළහ. බුදුන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වය හා අනුශාසනා පිළිගත් ප්‍රථම රහත් සැටනමගේ පරාර්ථ සාධනීය වූ ධර්ම ප්‍රචාරක වැඩපිළිවෙළෙහි සාර්ථකත්වය නිසාවෙන් ම බෞද්ධ භික්ෂු ශාසනයෙහි පිරිස ක්‍රමක්‍රමයෙන් වර්ධනය විය. බුදුරජාණන් වහන්සේ උභතෝ සංඝයා වෙත පැවිද්ද හා උපසම්පදාව ලබා දීමේ අයිතිය පැවරීමත් සමඟ භික්ෂු සමාජයෙහි ශීඝ්‍ර වර්ධනයක් සිදු වූ බව පෙනේ. එහෙයින් සංචාරක යුගයේ විසූ භික්ෂුව ආරාමික යුගයටත්, ආරාම ප්‍රතිග්‍රහණයටත් ප්‍රවිෂ්ට වූ බව ග්‍රන්ථාගත තොරතුරුවලින් අනාවරණය වේ. මෙලෙස පඨමාභිසම්බෝධි යුගය හෙවත් බුද්ධත්වයෙන් වසර විස්සක් වූ විනය ශික්ෂා පැනවීමට පෙර යුගයෙහි සසර දුකෙහි අනිටු විපාක දුටු බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර ආදි පිරිස් වර්ණ භේදයෙන්, කුල භේදයෙන් තොර ව භික්ෂුත්වයට ප්‍රවිෂ්ට වී නිර්වාණ සුව සාක්ෂාත්කරණය උදෙසා වෙහෙසුණෝ ය.

### බෞද්ධ වත්පිළිවෙත්

බුද්ධධරමාන සමය වන විට භාරතීය සමාජය තුළ විවිධ ශ්‍රමණ සම්ප්‍රදායයන් වූ අතර ඔවුන් විසින් ස්වීය පැවැත්ම උදෙසා විවිධ වත්පිළිවෙත් හා චර්යා රටාවන් පවත්වා ගෙන යන ලදි. බුද්ධ ශ්‍රාවක වූ බෞද්ධ භික්ෂු සම්ප්‍රදාය මොවුන්තුරෙන් සුවිශේෂ වූ පිරිසකි. එහෙයින් බුදුන් වහන්සේට අවශ්‍ය වූයේ පවතින ක්‍රමවේදයන්ට වඩා සුවිශේෂී වූ ක්‍රමවේදයක් හඳුන්වා දීමට ය. එහෙයින් බෞද්ධ භික්ෂු සමාජයේ යහපැවැත්ම හා චිර පැවැත්ම උදෙසා බුදුන් වහන්සේ විසින් විවිධ යහපත් වූ ක්‍රමවේදයන් හඳුන්වා දුන්හ. "බෞද්ධ වත්පිළිවෙත්" යනු බුදුන් වහන්සේගේ දේශනා තුළ එන සුවිශේෂී ආචාර ධර්මානුගත ඉගැන්වීමකි.

වෘතවෘතවත්තවතවත් යන වාග් විද්‍යාත්මක පද විකාශය තුළින් සංස්කෘත භාෂාවෙහි වෘත (ව්‍රත)යන්න පාලි භාෂාවෙන් වතවත්ත යනුවෙන් ද සිංහල භාෂාවට වත් යනුවෙන් ද පැමිණ ඇති බව පෙනේ. මේ පිළිබඳ විවිධ අර්ථකථන වියත්හු සපයා ඇති බව විවිධ භාෂානුගත ශබ්දකෝෂ විමසීමෙන් පැහැදිලි වේ. වත ව්‍රතය, පැවැත්ම, පිළිපැදීම, වත්ත වතාවත, කළ යුතු දෙය (හැමදීම්, පැන් ගෙන ඊම් ආදිය) යනුවෙන් පාලි සිංහල අකාරාදිය අරුත් සපයයි.[10] මෙම අදහසට සමාන ව යන අරුතක් මඩිතියවෙල සුමංගල හිමියන්ගේ පාලි සිංහල ශබ්ද කෝෂයෙහි සඳහන් වේ. වත්ත ආචාරය, පැවතීමෙහි යනුවෙන් අරුත් සපයා ඇත.[11] මේ අනුව වත්ත යන පාලි වචනය සඳහා බොහෝවිට වත්පිළිවෙත් යන තේරුම සපයා ඇති බව පෙනේ. ''වත්'' හා ''පිළිවෙත්'' යන වචන දෙක එකට යෙදුන ද මෙම වචන දෙකින් ප්‍රකාශිත වන්නේ අරුත් දෙකකි. ඉංග්‍රීසියෙන් වත්පිළිවෙත් යන්නට ''practices and duties'' යනුවෙන් යොදා ඇති බව ඉංග්‍රීසි ශබ්දකෝෂවලින් පැහැදිලි වේ.[12] ක්‍රියාකාරීත්වය, අභ්‍යාසය, පුහුණුව, හැකියාව ආදි අර්ථයන් වත් යන්න සඳහා භාවිත වේ. ''පිළිවෙත්'' යනු වගකීම, වගවීම, හැසිරීම, ආචාරශීලිත්වය, කාර්යය ඉටුකිරීම යන අරුත් දෙන පදයකි. උදාහරණයක් ලෙස දානශාලා වත හෙවත් දානශාලා වත්පිළිවෙත් ගැන

විමසීමේ දී දානශාලාවත් යනු දානශාලාව පොදුවේ භික්ෂූන් විසින් පාවිච්චි කරන ලද හෙයින් එය අලංකාර ව, පිරිසිදු ව, පිළිවෙළකට පවත්වා ගෙන යාම හෙවත් භෞතික අලංකරණය, භෞතික පැවැත්ම යහපත් ලෙස පවත්වාගෙන යාමට ක්‍රියාකාරී වීම ය.[13]

"දානශාලා පිළිවෙත" යනු දානශාලාවේ දී භික්ෂුවගේ ක්‍රියාකාරිත්වයයි. අනුපිළිවෙළ, ආහාර අපතේ නොදැමීම, නිශ්ශබ්දතාවය ආදී වශයෙන් පොදු ස්ථානයක පැවතිය යුතු පුද්ගල ක්‍රියාකාරිත්වය, සාමූහිකත්වය ආදියයි.

එනම් යහපත් මානව සම්බන්ධතා තුළින් මෙරමාට මෙන් ම තමාට බාධා විරහිත ව කාර්යය ඉටු කිරීම හා ඉටු කිරීමට වග බලා ගැනීමයි.[14]

"වත්තං න පරිපූරෙන්තො සීලං න පරිපූරතී" යන බුද්ධ දේශනාවට අනුව වත්පිළිවෙත් නොපුරන්නා නොවඩන්නා සීලය නොපුරයි. එයින් ගම්‍ය වන්නේ වත්පිළිවෙත් සීලය හා බද්ධ ව පවත්නා බවයි. සීලයෙහි චාරිත්‍ර සීලමය අංශය මේ තුළත් ගම්‍ය වේ. එනම්, කළ යුතු දේවල් ය. බෞද්ධ භික්ෂු සමාජයේ මූලික අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා හා පරමාදර්ශිත්වය සුරක්ෂිත කිරීම උදෙසා චාරිත්‍ර සීලය උපකාරි වන බව විනය පිටකයෙහි සඳහන් වෙයි. භික්ෂූන් වහන්සේලාගේ සදාචාරමය සංරක්ෂණය හා හික්මවීම උදෙසා වත්පිළිවෙත් මහෝපකාරි වන බව දීඝනිකාය සාමඤ්ඤඵල සූත්‍රයෙහි සඳහන් වෙයි. එහිදී භික්ෂූන් වහන්සේ සීල සම්පන්න වීම (සීල සම්පන්නෝ හෝති), ඉන්ද්‍රිය සංවරය (ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරෝ හොති), ආහාරයෙහි පමණ දැනීම (භෝජනෙ මත්තඤ්ඤූ), සිහියෙන් හා නුවණින් යුක්ත වීම (සතිසම්පජඤ්ඤෙන සමන්නාගතො හොති.)[15] යනුවෙන් සඳහන් වෙයි.

බුදුන් වහන්සේ දේශනා කළ සීල සංරක්ෂණයෙහි ප්‍රභේද දෙකකි. එනම්, චාරිත්‍ර සීලය හා වාරිත්‍ර සීලය යනුවෙනි. මෙයින් වතාවත් කිරීම, සීල රක්ෂණය හා එහි අන්තර්ගත වූ ක්‍රියාකාරිත්වය චාරිත්‍ර සීලය නම් වන අතර විරමනය හෙවත් වැළකිය යුතු දෙයින් වැළකීම වාරිත්‍ර සීලය නම් වේ. තත්කාලීන ශ්‍රමණ සම්ප්‍රදායයන් බෞද්ධ භික්ෂුව වෙන් කොට හඳුනා ගන්නා ලද්දේ වත්පිළිවෙත් තුළ අන්තර්ගත වූ මෙම ක්‍රියාකාරිත්වය පදනම් කොට ගෙන ය. ත්‍රිපිටකාගත විවිධ සූත්‍ර දේශනාවල වත්පිළිවෙත්හි අන්තර්ගත සීල ප්‍රතිපදාව පිළිබඳ ව විග්‍රහ වෙයි. සුත්තනිපාත කිංසීල සූත්‍රයෙහි වැඩිහිටියන්ට සැලකීම, ඊර්ෂ්‍යා නොකිරීම, කාම සිතිවිලි නොඉපදවීම, ගුරුවරයාට අවනත වීම, උදයව්‍ය ඥාණය දියුණු කිරීම, තිරච්ඡාන කථාවලින් වැළකීම, විදර්ශනා ප්‍රතිසංයුක්ත කථාවලින් යුතු වීම, කොක් හඬලා සිනා නොවීම, සුළු දෙයකට කලබල නොවීම, අනුන් නොරැවටීම, කුහකකම් නොකිරීම, සිව්පසයට ගිජු නොවීම, අහංකාර නොවීම (උඩඟු නොවීම), එකට එක නොකීම හා නොකිරීම, කාමාශාව දුරු කිරීම, තණ්හාව දුරු කිරීම, නිවැරදි ක්‍රියා කිරීම හා දියුණු කිරීම, නිවැරැදි සිතුවිලි වර්ධනය කිරීම යනාදි වශයෙන් වත්පිළිවෙත්හි ක්‍රියාකාරිත්වය පෙළගැස්මක් දක්නට ලැබෙයි.[16] වත්පිළිවෙත්හි මූලබීජ සාකච්ඡා කරන මෙම සූත්‍රය චාරිත්‍ර-වාරිත්‍ර යන දෙඅංශය ම විමර්ශනය කරයි. සමාජයෙහි යහපැවැත්ම උදෙසා හා බෞද්ධ භික්ෂු සමාජයෙහි සුරක්ෂිතභාවය උදෙසා වෙසෙසින් ම වැදගත් වන

සාධකයන් මෙහි දී සාකච්ඡා වෙයි. එහෙයින් බෞද්ධ වත්පිළිවෙත් භික්ෂු සමාජයෙහි මෙන් ම ගිහි සමාජයේ සදාචාර සංවර්ධනය උදෙසා මහෝපකාරී වන බව පැහැදිලි වෙයි.

**චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකය**

බුදුන් වහන්සේ පන්සාළිස් වසක් දේශනා කළ ශ්‍රී සද්ධර්මය පළමු ධර්ම සංගායනාවෙන් පසුව පිටකත්‍රයක් තුළ සංගෘහිත විය. එනම් විනය පිටකය, සූත්‍ර (සුත්ත) පිටකය, හා අභිධම්ම පිටකය වශයෙනි. විනය පිටකය පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, මහාවග්ග පාළි, චුල්ලවග්ග පාළි හා පරිවාර පාළි යන ග්‍රන්ථ පහක් යටතේ සංග්‍රහ වී ඇත. මෙම ග්‍රන්ථ පහ නැවත උභතෝ විභංග, ඛන්ධක, පරිවාර යනුවෙන් වර්ගීකරණය විය. මෙහි උභතෝ විභංග යටතේ පාරාජිකා පාළි, පාචිත්තිය පාළි යන ග්‍රන්ථ දෙක අන්තර්ගත කොට ඇත. ඛන්ධක යටතේ මහාවග්ග පාළි හා චුල්ලවග්ග පාළි යන ග්‍රන්ථ දෙක එන අතර පරිවාර පාළි ග්‍රන්ථය පරිවාර යන කොටස යටතේ සංගෘහිත ය.

බෞද්ධ භික්ෂු සමාජයෙහි චරණ ශික්ෂණය ඛන්ධක විනය යටතේ විස්තර වන අතර මහාවග්ග පාළි හා චුල්ලවග්ග පාළි යන ග්‍රන්ථ දෙක මේ තුළ අන්තර්ගත ය. භික්ෂු භික්ෂුණීන් උදෙසා පොදුවේ පිළිපැදිය යුතු පොහොය කිරීම, වස් විසීම, ඇවැත් දෙසීම, පැවිදි උපසම්පදා කිරීම යන වත්පිළිවෙත් සියල්ල මෙමඟින් සාකච්ඡා කෙරෙයි. අපගේ ප්‍රස්තුතයට අදාළ චුල්ලවග්ග පාළියෙහි ඛන්ධක දොළහක් (12) අන්තර්ගත ය. මෙහි එන අවසාන ඛන්ධක දෙක පසුකාලීන බව පොදු පිළිගැනීමයි.

එම ඛන්ධක දෙකෙහි ධර්ම සංගායනා පිළිබඳ තොරතුරු ඇතුළත් හෙයින් ඒවා පසුකාලීන ව  එකතු කරන ලද බව වියතුන්ගේ පිළිගැනීමයි. චුල්ලවග්ග පාළිය ට ඇතුළත් ඛන්ධක දොළහ (12) නම්,

1. කම්මක්ඛන්ධකය
2. පරිවාසිකක්ඛන්ධකය
3. සමුච්චයක්ඛන්ධකය
4. සමථක්ඛන්ධකය
5. ඛුද්දකවත්ථුක්ඛන්ධකය
6. සෙනාසනක්ඛන්ධකය
7. සංඝභේදක්ඛන්ධකය
8. වත්තක්ඛන්ධකය
9. පාතිමොක්ඛ ඛන්ධකය
10. භික්ඛුණීක්ඛන්ධකය
11. පඤ්චසතිකක්ඛන්ධකය
12. සත්තසතිකක්ඛන්ධකය යනුවෙනි,

මෙම ඛන්ධක දොළහ තුළින් වත්තක්ඛන්ධකය වැදගත් වන්නේ භික්ෂු සමාජයෙහි චර්යා පද්ධතිය හරවත් කිරීමට අවශ්‍ය හර පද්ධතිය අන්තර්ගත වන නිසාවෙනි. මේ තුළ සංගෘහිත වන වත් දාහතරකි (14). එනම්,

1. ආගන්තුක වත
2. ආවාසික වත
3. ගාමික වත
4. අනුමෝදනා වත
5. භත්තග්ග වත
6. පිණ්ඩචාරික වත
7. ආරඤ්ඤික වත
8. සේනාසන වත
9. ජන්තාඝරවත
10. වච්චකුටි වත
11. උපජ්ඣාය වත
12. සද්ධිවිහාරික වත
13. ආචරිය වත
14. අන්තෙවාසික වත යනුවෙනි,

මෙලෙස චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි භික්ෂුව විසින් අනුගමනය කළ යුතු වත්පිළිවෙත් දාහතරක් සඳහන් කර ඇති බව පෙනේ.

**බෞද්ධ භික්ෂු සමාජයෙහි ආරාමික වත්පිළිවෙත්**

බෞද්ධ භික්ෂු සමාජයෙහි ආරාම ප්‍රතිග්‍රහණයෙන් පසු භික්ෂුව වාසය කරන ස්ථානය ආරාමය නම් විය. ආරාම, විහාර යන නාම භාවිත කරමින් ත්‍රිපිටකයෙහි මෙය හඳුන්වා ඇත්තේ අනගාරික පැවිද්ද ලැබූ භික්ෂුව විසින් වාසය කරන වාසස්ථානය හැඳින්වීම සඳහා ය. ආරාමය යන්න ත්‍රිපිටකය, අට්ඨකථා ආදි ප්‍රාථමික මූලාශ්‍රයවල මෙන් ම නූතන ශබ්ද කෝෂයන්හි විවිධ අරුත් ඇති පදයක් ලෙසින් විවරණය කොට ඇති බව පෙනේ.

තාපසවරුන්, සෘෂිවරුන්, යෝගීන් හා භික්ෂූන් වාසය කරන ස්ථානය, සිත් අලවන ප්‍රියකරන උයන, මල්ඵල හටගන්නා ගස් ගස්වැල් ආදියෙන් පිරි උයන, ක්‍රීඩා උයන ආදිය අරුත් ඇති පදයක් ලෙසින් ''ආරාම'' යන්න සිංහල විශ්වකෝෂයෙහි හඳුන්වයි[17]. මනෝරථපූරණී නම් වූ අංගුත්තර නිකාය අට්ඨකථාවෙහි පුෂ්ප - ඵල ආදි සෝභාව නිසාවෙන් ගොදුරු ගමට ඉතා දුර නොවීම ඉතා ළං වීම ආදි පංචවිධ

සේනාසනාංග සම්පත්ති නිසාවෙන් ද අනගාරික වූ පැවිද්දෝ ඒ ඒ දිශාවලින් අවුත් මෙහි සිත් අලවා වෙසෙත්හු පුෂ්ප ඵල ආදිය හේතු කොටගෙන බැහැර ගියවුන් නැවත අභ්‍යන්තරයට කැඳවා අභිරමණය කරන්නේ එය ''ආරාම'' නම් වේ.[18]

යනුවෙන් ඉතා රමණීය, සිත්කළු වූ සුගන්ධිත පුෂ්පයෙන් හා සුමිහිරි වූ ඵලවලින් බර වූ සොඳුරු නවාතැන ආරාමය වශයෙන් හඳුන්වා ඇත. ඒ නිසාවෙන් ම පුෂ්පාරාම, ඵලාරාම, තාපසාරාම, සංඝාරාම, ආදි ව්‍යවහාරයන් ද ආරාම සඳහා භාවිත වී තිබෙන බව ත්‍රිපිටකාගත තොරතුරු මගින් අනාවරණය වේ.

"අගාරස්මා අනගාරියං පබ්බජන්ති"[19] ගිහිගෙහි අනේකවිධ වූ දුක් දොම්නස් කම්කටොළු නිසාවෙන්ම අනගාරික ව පැවිදි දිවියට පිළිපන් භික්ෂුවට මුල්කාලයේදී වාසස්ථාන, ආරාම නොවීය. කල්ගතවෙත් ම ආරාම ප්‍රතිග්‍රහණය සිදු වුවත් අනගාරික පැවිද්ද වූ නිසාවෙන් ම ආරාමයක, යම් ස්ථානයක, වාසස්ථානයක, ගෙයක අයිතිය අනගාරික පැවිද්ද සඳහා හිමි නොවීය. කෙසේ වෙතත් බෞද්ධ භික්ෂුව වාසය කරන ස්ථානය අනෙක් විවිධ තාපස, ශ්‍රමණාදීන්ට වඩා වෙනස් ක්‍රමවේදයකට පැවතිය යුතු නිසාවෙන් ම බුදුන් වහන්සේ ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබාදුන්හ. බෞද්ධ ආරාමයක පැවතිය යුතු ක්‍රමවේදය, පිළිවෙළ, වතාවත් හා වත්පිළිවෙත් ක්‍රමවේදය බුදුන් වහන්සේ දේශනා කළහ. චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි සඳහන් වත් දාහතර බෞද්ධාරාමික ක්‍රමවේදය සනිටුහන් කරයි.

### 1. ආගන්තුක වත

පාවහන් ගලවා කුඩය හකුලා ආරාමයට පිවිසීම, පා-සිවුරු එකත් පසෙක තැබීම, සුදුසු අසුනක් ගෙන හිඳගැනීම, පානීය පරිභෝජනීය පැන් ගැන විමසීම, පාවහන් සෝදා පිරිසිදු ව සුදුසු තැනක තැබීම, ආරාමයෙහි වාසය කරන භික්ෂූන් වහන්සේලා වැඩිමහලු නම් වැඳීම, නවක නම් අභිවාදනයෙන් පිළිගැනීම, ගරු සත්කාර දැක්වීම, සේනාසනයක් කුටියක් පිළිබඳ විමසීම, ගෝචර හා අගෝචර ගම් පිළිබඳ විමසීම, සේඛ සම්මත වූ කුලයන් පිළිබඳ විමසීම, වැසිකිළි කැසිකිළි ගැන විමසීම, පිවිසිය යුතු හා නික්මිය යුතු කාලය විමසීම, විහාර, වැසිකිළි, කැසිකිළි, ආරාම, කුටි ආදිය අපිරිසිදු නම් පිරිසිදු කිරීම.[20] යනාදි වත්පිළිවෙත් සමූහයක් ආගන්තුක භික්ෂූන් වෙත හඳුන්වා දී ඇති බව පෙනේ.

### 2. ආවාසික වත

ආගන්තුක වැඩිමහලු භික්ෂූන් දැක නැගිට ආසන පැනවීම, පා සෝදන වතුර, පා පුටු, පා තබන ලෑලි කැබලි සමීපයෙහි තැබීම, පෙර ගමන් කොට පාත්‍ර සිවුරු පිළිගැනීම, බීමට ජලය විමසීම, ආගන්තුක භික්ෂුව වැඩිමහලු නම් වැඳීම, සෙනසුන් පැනවීම, ආරාමයෙහි වසන භික්ෂූන් වැඩි මහලු නම් වැඳීම, නවක නම් අභිවාදනයෙන් පිළිගැනීම, පානීය පරිභෝජනීය ජලය පැවසීම, පාවහන් සෝදා පිරිසිදු ව තැබීම, ගෝචර ගම හා අගෝචර ගම පැවසීම, සේඛ සම්මත වූ කුල පැවසීම, වැසිකිළි කැසිකිළි පැවසීම, කවර කාලයක පිවිසිය යුතු දැයි කවර කාලයක

නික්මිය යුතුදැයි පැවසීම, සංඝයාගේ කතිකාවත් පැවසීම.[21] යනාදි වශයෙන් ආවාසය තුළ කළ යුතු වූ ආවාසික වත්පිළිවෙත් මාලාවක් සඳහන් වෙයි.

### 3. ගමික වත

ආරාමයෙහි භාණ්ඩ සකස් කොට තබා දොර ජනෙල් වසා සෙනසුන භාරදී යාම, ආරාමය භාරදීමට භික්ෂූන් වහන්සේ නමක් නැති නම් සාමණේර නමකට, ආරාමිකයකුට හෝ උපාසකයකුට භාරදීම, එසේ නොවන්නේ නම් ආරාමයෙහි භාණ්ඩ ආරක්ෂාකාරී ව තැන්පත් කොට දොර ජනෙල් වසා යාම, විහාරය වැස්සට තෙමෙන්නේ නම් හැකියාවක් ඇත්නම් සෙවිලි කිරීම.[22] ආරාමයට පැමිණි භික්ෂූන් වහන්සේලා පිට ව යන විට පිළිපැදිය යුතු වත්පිළිවෙත් මාලාවක් ගාමික වත් තුළ අන්තර්ගත ය.

### 4. අනුමෝදනා වත

භික්ෂූන් වහන්සේලා දානය වළඳා දානය ගැන කිසිවක් නොදෙසා ආරාමවලට වැඩම කිරීම මුල් කාලයේදී සිදුවිය. දානය පිළිගන්වන අය මේ ගැන කළකිරී විවිධ දෝෂාරෝපණයන් එල්ල කරමින් භික්ෂූන්ගේ අගුණ ප්‍රකාශ කරති.[23] එහෙයින් බුදුන් වහන්සේ "අනුජානාමි භික්ඛවේ භත්තග්ගේ අනුමෝදිතුන්ති."[24] යනුවෙන් "මහණෙනි, භෝජන ශාලාවේදී අනුමෝදනා බණ කියන්නට අනුදැන වදාරමි" යනුවෙන් මෙම පැනවීම කළහ. මේ අනුව අනුමෝදනා වත වත්පිළිවෙතක් වශයෙන් අනුගමනය විය.

### 5. භත්තග්ග වත

මනාව සිවුරු ඇඳ පොරවා සංවර ව ගමට පිවිසීම හා ගමෙහි හැසිරීම, වැඩිමහළු හෙවත් ස්ථවිර භික්ෂූන් වහන්සේලා ඉක්මවා ඉදිරියෙන් නොයෑම, මනා වූ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත ව හිඳගැනීම, වතුර පිළිගැනීම, සේදීම හා මනා වූ සංවරයෙන් යුතු ව දානය වැළඳීම, සැමට සම සමව බෙදා දීම හා සිහියෙන් යුතුව වැළඳීම, අධික ආශාවෙන් සූපයන් හෝ ව්‍යංජනයකින් හෝ බතින් නොවැළඳීම, ගිලන් නොවූවන් විසින් තමන් වෙනුවෙන් සකසවාගත් ව්‍යංජන නොවැළඳීම, ඊර්ෂ්‍යා සහගත සිතින් අන්‍යයන්ගේ පාත්‍රය දෙස නොබැලීම, දන් වැළඳීමෙන් අනතුරු ව නව භික්ෂූන් වහන්සේලා ආපසු හැරී පළමු ව වැඩමවීම.[25] යනාදි වශයෙන් දාන ශාලාවේ දී අනුගමනය කළ යුතු වත් පිළිවෙත් මෙහිදී සඳහන් වේ.

### 6. පිණ්ඩ චාරිකා වත

මනාව සිවුරු හැඳ පොරවා සංවර ව ගමට පිවිසීම හා මනා සංවරයකින් ගමෙහි හැසිරීම, ස්ථවිර භික්ෂූන් වහන්සේලා ඉක්මවා ඉදිරියට නොයාම, මනා වූ සංවර ඉරියව්වෙන් යුක්ත ව දානය පිළිගැනීම, නිවසට ඇතුළු වන හා පිට වන මාර්ග පිළිබඳ මනා අවබෝධය, පානීය පරිභෝජනීය ජලය ගෙනවිත් තැබීම, දන් වළඳන ස්ථානය ඇමදීම හා පිරිසිදු කිරීම, වළඳා ඉතිරි දානය ප්‍රාණීන් නැති ජලයෙහි පා කිරීම හෝ නිල් තණකොළ නැති ස්ථානයකට දැමීම, ආසනය ඔසවා තැබීම, හා පා පුටු තබන ලෑලි තැන්පත් කිරීම හා වළඳා ඉතිරි ආහාර භාජනය පිරිසිදු කිරීම.[26]

පිණ්ඩපාතයෙහි වඩින භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ යුතු පිළිපැදිය යුතු වත් පිළිවෙත් රැසක් මෙහිදී විග්‍රහ වේ.

### 7. ආරඤ්ඤික වත

මනාව සිවුරු හැඳ පොරවා සංවර ව ගමට පිවිසීම හා ගමේ හැසිරීම, ඇඳ පුටු ආදි භාණ්ඩ සුරක්ෂිත ව තබා පිට වීම, මනා වූ සංවර ඉරියව්වලින් යුතු ව දානය පිළිගැනීම, නිවසට පිවිසෙන හා පිට වන මාර්ග පිළිබඳ මනා අවබෝධය, දන් දෙන අයගේ මුහුණ දෙස ඍජු ව නොබැලීම, සියලු ම හෝ ඒකදේශ නැකත් පද ඉගෙනීම, දිසා දැනීමෙහි දක්ෂ වීම, පානීය පරිභෝජනය ජලය, ගිනි, ගිනි දැල්වීමට ගන්නා ලී සැර මිටි තැබීම.[27] ආරණ්‍යයෙහි වාසය කරන භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ, අනුගමනය කරන වත් පිළිවෙත් ආරඤ්ඤික වතෙහි සඳහන් වෙයි.

### 8. සේනාසන වත

විහාරස්ථානය අවට පරිසරය පිරිසිදු ව තබා ගැනීම, සේනාසනයෙහි භාණ්ඩ පිරිසිදු ව ආරක්ෂාකාරී ව තැබීම, නුසුදුසු ස්ථානවල සේනාසන ඇතිරිලි ආදිය ගසා නොදැමීම, පානීය පරිභෝජනීය පැන් තැබීම, දූවිලි හමන දිශාවන්ට අනුව එම දිශාවන්හි ජනෙල් වැසීම, සුදුසු අවස්ථාවන්හි දොර ජනෙල් වැසීම, විහාරය,කොටුව, උපස්ථාන ශාලාව, ගිනිහල, වැසිකිළි යන ස්ථාන පිරිසිදු කිරීම, වැඩිමහලු භික්ෂූන්ගෙන් නොවිමසා පෙළ කියා දීම ආදි කටයුතු නොකිරීම.[28] සේනාසනයෙහි හා එහි අවට පරිසරය පිළිබඳ ව අනුගමනය කළ යුතු වත් පිළිවෙත් මෙහි දී සාකච්ඡා වෙයි.

### 9. ජන්තාඝර වත

ගිනිහල් ගෙයි අළු පිරී ඇත්නම් ඒවා ඉවත් කිරීම, ගිනිහල්ගෙය, පිල්කඩ, පිරිවෙණ, කොටුව, ගිනිහල් ගෙයි ශාලාව යන ස්ථාන පිරිසිදු කිරීම, ශරීරයෙහි ගාන සුණු සිනිඳු කිරීම හා මැටි තෙමීම, දිය ඔරුවෙහි ජලය තැබීම, සුදුසු පරිදි ආවරණය කොටගෙන ගිනිහල් ගෙයි පුටුව ගෙන ගිනිහල් ගෙට පිවිසීම හා පිටවීම, ස්ථවිර භික්ෂූන් නොගටා හිඳ ගැනීම හා නවක භික්ෂූන් ආසනයෙන් බැස්සවීම, ස්ථවිර භික්ෂූන් ඉදිරියෙහි ස්නානය නොකිරීම, ස්ථවිර භික්ෂූන්ට පිරියම් කිරීම, ස්නානය කොට ගොඩ වන භික්ෂූන් ජලයට බසින භික්ෂූන්ට මාර්ගය දීම, ගිනිහල්ගෙය හා එහි භාණ්ඩ පිරිසිදු කර තබා ගිනි නිවා දොරටු වසා බැහැර වීම.[29] භික්ෂූන් වහන්සේලා විසින් ගිනිහල්ගෙය පරිහරණය කිරීමේ දී අනුගමනය කළ යුතු වත් පිළිවෙත් මෙහිදී විස්තර වන අතර මෙහි ගිනිහල්ගෙය යනුවෙන් හඳුන්වන්නට ඇත්තේ "හුමාලයෙන් අඟ රත් කිරීමට සාදන ලද ගෙයක් " විය හැකි යැයි වියත් මතය යි.

### 10. වච්චකුටි වත

වැසිකිළි කොට සේදීම, පැමිණි පිළිවෙලට වැසිකිළියට යාම, වැසිකිළියට යන්නා ද වැසිකිළියෙහි සිටින්නා ද උගුර පෑදීම, සිවුරු මනා සේ තැන්පත් කිරීම,

ඉතා ඉක්මනින් නොපිවිසීම හා නොපිටවීම, සිවුරු අඳන සුදුසු ස්ථානයන්හි සිට එසවීම හා වසා ගැනීම, තතනමින් වැසිකිළි නොකිරීම, දැහැටි දඬුකමින් වැසිකිළි නොකිරීම, මූත්‍රා ඔරුවෙන් පිට මූත්‍රා නොකිරීම, මූත්‍රා ඔරුවෙහි කෙළ නොගැසීම, රළු දණ්ඩෙන් මළ සූරා නොදැමීම, මළ සූරා දමන දඬු වැසිකිළියට නොදැමීම, චපු චපු යන ශබ්දය ඇසෙන සේ නොසේදීම, වැසිකිළිය සඳහා භාවිත කළ ජල භාජනයෙහි ජලය ඉතිරි නොකිරීම, වැසිකිළියේ පිළ, පිරිවෙන, කොටුව, යන ස්ථාන පිරිසිදු කිරීම, මළ පිසින දඬු දමන භාජනය පිරිසිදු කිරීම, සෝදන කළයෙහි ජලය පිරවීම.[30] වච්චකුටියෙහි දී හෙවත් වැසිකිළියෙහි දී අනුගමනය කළයුතු වත්පිළිවෙත් හෙවත් වතාවත් මෙහි සාකච්ඡා කෙරෙයි.

### 11. උපජ්ඣාය වත

වේලාසනින් ම නැඟිට වහන් මුදා උතුරු සළුව, දැහැටි දඬු, මුව ධෝවන ජලය දීම, ආසන පැනවීම හා හකුළා තැබීම, කැඳ ජලය ආදිය පිළිගැන්වීම හා භාජන පිරිසිදු කිරීම, දාන ශාලාව ආදි ස්ථාන පිරිසිදු කිරීම, ගමට පිවිසෙන උපාධ්‍යායයන් වහන්සේට අඳනය, පටිය, පාත්‍රය දීම, නැවත පිළිගැනීම හා සුදුසු පරිදි තැන්පත් කිරීම, උපාධ්‍යායයන් වහන්සේ පසුපසින් යන ශ්‍රමණයකු වීම, උපාධ්‍යායයන් වහන්සේ කථා කරන අතරතුර කථා නොකිරීම, සිහිල් පැන් හා උණු පැන් තැබීම, පා ධෝවන ආදි වත් පිළිවෙත් කිරීම, විහාරය නිසි පරිදි පිරිසිදු කිරීම, දූවිලි හමන දිශාවන් අනුව ජනෙල් වැසීම, සුදුසු අවස්ථාවන්හි දොර ජනෙල් වැසීම හා ඇරීම, විහාරය, කොටුව, උපස්ථාන ශාලාව, ගිනිහල, වැසිකිළිය යන ස්ථාන පිරිසිදු කිරීම, උපාධ්‍යායයන් වහන්සේට සසුනෙහි කුකුසක් විරතියක් මිථ්‍යා දෘෂ්ටියක් ඇති වී නම් එය දුරු කිරීම හෝ කරවීම, උපාධ්‍යායයන් වහන්සේ ඇවතකට පත් වී නම් සුදුසු ප්‍රතිකර්ම විනය කර්ම කිරීම, උපාධ්‍යායයන් වහන්සේගෙන් නොවිමසා පාත්‍ර සිවුරු දීම, පිළිගැනීම ආදි වත්පිළිවෙත් නොකිරීම, සුදුසු පරිදි උපස්ථාන කිරීම.[31] යනුවෙන් උපාධ්‍යායයන් වහන්සේ වෙත සද්ධිවිහාරිකයා නම් උපාධ්‍යායයන් වහන්සේගෙන් පැවිද්ද උපසම්පදාව ලැබූ තැනැත්තා විසින් කළ යුතු අනුගමනය කළ යුතු වත්පිළිවෙත් මෙහි දී සාකච්ඡා විය.

### 12. සද්ධිවිහාරික වත

විමසීමෙන් අවවාදයෙන් අනුශාසනයෙන් සංග්‍රහ කිරීම, සුදුසු පරිදි උපස්ථාන කිරීම, පා සිවුරු ආදිය දීම, ගිලන් වූ කල උපස්ථාන කිරීම, ආසන පැනවීම හා හකුළා තැබීම, කැඳ ආදිය සැපයීම හා භාජන පිරිසිදු කිරීම, අඳනය, පටිය, පාත්‍රය දීම නැවත පිළිගැනීම හා සුදුසු පරිදි තැන්පත් කිරීම, විහාරය පිරිසිදු කිරීම, පානීය පරිභෝජනීය ජලය ගෙනවිත් තැබීම, සසුනෙහි කුකුසක් විරතියක් මිථ්‍යා දෘෂ්ටියක් ඇති වී නම් දුරු කිරීම හා දුරු කරවීම, ඇවතකට පත් වී නම් සුදුසු විනය කර්ම කිරීම, සුදුසු පරිදි උපස්ථාන කිරීම.[32] යනාදි වශයෙන් සද්ධිවිහාරික වත දක්වා ඇති අතර සද්ධිවිහාරිකයාගෙන් උපස්ථාන ලබන උපජ්ජායයන් වහන්සේ ද සද්ධිවිහාරිකයාට සුදුසු පරිදි උපස්ථාන කළ යුතු බව සඳහන් වෙයි.

### 13. ආචරිය වත

උදෑසනින් අවදි වී වහන් මුදා උතුරුසළු දැහැටි දඬු මුව ධෝවන ජලය දීම, ආසන පැනවීම හා හකළා තැබීම, කැද පිළිගැන්වීම හා භාජන පිරිසිදු කිරීම, විහාරය නිසි පරිදි පිරිසිදු කිරීම, ගමට පිවිසෙන ආචාර්යයන් වහන්සේට අඳනය, පටිය, පාත්‍රය දීම, නැවත පිළිගැනීම හා තැන්පත් කිරීම, පසුපසින් යන ශ්‍රමණයකු වීම, ආචාර්යයන් වහන්සේ කථා කරන අතරතුර කථා නොකිරීම, සිසිල් උණු පැන් තැබීම, ස්ථවිර භික්ෂූන්ගේ ඇඟ නො ගෑවීම, නවකයන් අසුනෙන් බැහැර නොකිරීම, පා ධෝවන පැන් දී වතාවත් කිරීම, විහාරය පිරිසිදු කිරීම, දූවිලි හමන දිශාව අනුව ජනෙල් වැසීම, සුදුසු අවස්ථාවන්හි දොර ජනෙල් වැසීම, සසුනෙහි කුකුසක් විරතියක් මිථ්‍යා දෘෂ්ටියක් ඇති වී නම් දුරුකිරීම හා දුරු කරවීම, ඇවතකට පත් වී නම් විනය කර්ම සිදුකිරීම, නිසි පරිදි උපස්ථාන කිරීම.[33] යනාදි වත්පිළිවෙත් ආචාර්යයන් වහන්සේ වෙත අන්තේවාසිකයා විසින් ඉටු කළ යුතු ය.

### 14. අන්තේවාසික වත

විමසීමෙන් අවවාදයෙන් අනුශාසනයෙන් සංග්‍රහ කිරීම, පා සිවුරු ආදිය දීම, ගිලන් වූ කල උපස්ථාන කිරීම, ආසන පැනවීම හා හකුළා තැබීම, කැඳ ආදිය සැපයීම හා භාජන පිරිසිදු කිරීම, අඳනය, පටිය, පාත්‍රය දීම නැවත පිළිගැනීම හා සුදුසු පරිදි තැන්පත් කිරීම, පානීය පරිභෝජනීය ජලය ගෙනවිත් තැබීම, සසුනෙහි කුකුසක්, විරතියක්, මිථ්‍යා දෘෂ්ටියක් ඇති වී නම් දුරු කිරීම හා දුරු කරවීම, ඇවතකට පත් වී නම් සුදුසු විනය කර්ම කිරීම, සුදුසු පරිදි උපස්ථාන කිරීම.[34] ආචාර්යවරයා විසින් අන්තේවාසිකයා හෙවත් අතවැසියා කෙරෙහි පිළිපැදිය යුතු ආකාරය මෙහි සඳහන් වේ. අන්තේවාසිකයා යනු ආචාර්යවරයා යටතේ ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගන්නා ය. මෙලෙස බෞද්ධ භික්ෂු සමාජයෙහි ආරාමික වත්පිළිවෙත් බුද්ධ ධර්මාන සමයේදී ම බුදුන් වහන්සේ භික්ෂුවගේ යහපැවැත්ම සුබ විහරණය උදෙසා දේශනා කර ඇති ආකාරය වත්තක්ඛන්ධකයෙන් පැහැදිලි වේ.

### නූතන භික්ෂු සමාජය හා බෞද්ධ ආරාමික වත්පිළිවෙත්

භික්ෂුව යනු භෞතික සම්පත්වලින් සපිරුණ සාරවත් ජීවිතය හැරදමා නිවන් සුව පසක් කරගැනීමේ අටියෙන් ආධ්‍යාත්මික ශාන්තියට මාර්ගය වන බ්‍රහ්මචාරී දිවියට ප්‍රවිෂ්ට වූවෙකි. පැවිද්ද සුවයක් වුව ද, පැවිදි ජීවන ගමන අතිශය දුෂ්කර වූවකි.[35] එම දුෂ්කර දිවියට ප්‍රවිෂ්ට වන පුද්ගලයා ගිහි ගෙයෙහි සම්බාධ සහිත, රාගාදි ක්ලේශයන්ගේ උත්පත්තියට ස්ථානයක් වන නිසාවෙන් ම හිස් අවකාශයක් වැනි වූ නිසා සසර ගමන නවතා නිවන පසක් කර ගැනීමේ අටියෙන් පැවිද්ද ලබාගනී.[36] පැවිද්ද හෙවත් භික්ෂුත්වය යනු පුද්ගල ඒකායන පරමාර්ථය වන නිවන පසක් කර ගැනීමට ඇති හොඳ ම තෝතැන්න බව පබ්බජ්ජා සූත්‍රයෙහි සඳහන් වෙයි.[37] විචක්ෂණශීලී වූ බුදුන් වහන්සේගේ ශ්‍රාවකයන් වූ භික්ෂූන් වහන්සේලා වත්පිළිවෙත් මැනවින් පුරන්නෝ ය. මෙය බුදුන් වහන්සේගේ අවවාදය යි. එයින් නිවන් සුව පසක් කරගන්නෝ ය. බුද්ධ දේශනාව වන්නේ වත්පිළිවෙත් පිරීම තුළින් සීලය පුරා

නිර්වාණය පසක් කරගත හැකි බව ය.[38] මේ අනුව වත්පිළිවෙත් පිරීමෙන් තොර වූ භික්ෂුව තුළ සීලය වැඩීමක් ද සීලය පිරීමක් ද නොමැත. එහෙයින් වත්පිළිවෙතින් තොර භික්ෂු සමාජයක චිරපැවැත්මක් ප්‍රාර්ථනා කළ නොහැකි ය. නූතන භික්ෂු සමාජය උදෙසා ද මේ සියල්ල ආදේශ කරගත යුතු ව ඇති බව පෙනේ. විහාරස්ථානයක වාසය කරන්නා වූ භික්ෂුව බුදුන් වහන්සේ දේශිත වත්පිළිවෙත් නිසි ලෙස පිළිපදින්නේ නම් කෙසේවත් ම භික්ෂු සමාජය තුළ විසමතාවයන් ඇති නොවන්නේ ය. චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකයෙහි එන වත්පිළිවෙත් බුද්ධ ධරමාන සමයේ සිට නූතන යුගය දක්වා ශාසනයේ චිරපැවැත්මට හේතු සාධක විය. විනය ශාසනයෙහි ආයුෂයි. (විනයෝ නාම සාසනස්ස ආයු) විනයෙන් තොර භික්ෂු ශාසනයේ චිර පැවැත්මක් ගැන සිතිය නොහැකි ය. එසේ ම බුදුන් වහන්සේ විසින් භික්ෂු සමාජයෙහි යහ පැවැත්ම උදෙසා වත්තක්ඛන්ධකයෙහි දේශිත ආරාමික වත්පිළිවෙත් හුදෙක් ම භික්ෂු සමාජයේ චිරස්ථායීභාවය උදෙසා උපයෝගී වේ. ආරාමයෙහි හෙවත් විහාරස්ථානයෙහි පවත්නා අපිළිවෙළ භික්ෂුවගේ සමස්ත ජීවන රටාවෙහි ම අපිළිවෙළක් බවට පත් වේ. එම කාරණය ඇතැම් විහාරස්ථානවල සංචරණයේ දී කෙනෙකුට දෘශ්‍යමාන වේ. ආගන්තුක වත, ආවාසික වත, ගාමික වත, අනුමෝදනා වත, භත්තග්ග වත, පිණ්ඩචාරික වත, ආරඤ්ඤක වත, සේනාසන වත, ජන්තාඝර වත, වච්චකුටි වත, උපජ්ඣාය වත, සද්ධිවිහාරික වත, ආචරිය වත හා අන්තේවාසික වත යනාදි වත් මඟින් ආරාමික ජීවිතයෙහි හා ආරාමික පැවැත්මෙහි සියලු අංශයන් ආවරණය වේ. මෙම වත්පිළිවෙත් අනුගමනය කිරීම තුළින් ආරාමයෙහි සමඟිය, සාමදානය, එකමුතුකම, සුහදත්වය හා යහපැවැත්ම වර්ධනය වන අතර චිරස්ථායී භික්ෂු සමාජයක් ද සමාජගත වේ. එසේම මෙම වත්පිළිවෙත් අනුගමනය කිරීම තුළින්,

- ★ භික්ෂු සමාජෙහි සමඟිය වර්ධනය වීම
- ★ ආදර්ශමත් භික්ෂුවක් සමාජගත වීම
- ★ විනය ගරුක භික්ෂුවක් නිර්මාණය වීම
- ★ බුදුන් වහන්සේ කෙරෙහි ගරුත්වය වර්ධනය වීම
- ★ ඔවුනොවුන්ගේ ගති පැවතුම් හඳුනාගැනීම
- ★ කර්මය හා කර්ම ඵලය විශ්වාස කිරීම
- ★ ක්‍රියාශීලිත්වය වර්ධනය වීම
- ★ විශ්වාසය හා ගරුත්වය වර්ධනය වීම
- ★ යහපත් පුරුදු සමුදායකට හුරුවීම
- ★ සෞඛ්‍ය සම්පන්න වීම
- ★ මානසික පීඩනයෙන් මිදීම

- ★ ආධ්‍යාත්මික සුවය ලබාගැනීම
- ★ ලෝකෝත්තර සුවයට ප්‍රවිෂ්ට වීම

යනාදි ප්‍රතිඵල හා ජීවිතයෙහි වෙනස්කම් සුභවාදී ව ළඟා කර ගත හැකි වනු ඇත. බෞද්ධ ආරාමික වත්පිළිවෙත් නූතන භික්ෂු සමාජයෙන් කෙමෙන් ගිලිහී යන බවක් පෙනේ. භික්ෂු සමාජයෙහි සහෝදරත්වය හා කළමනාකාරිත්වය රඳා පවතින්නේ වත්පිළිවෙත් තුළ හෙයින් මෙහි දැනුවත්භාවය ශාසනික චිරපැවැත්මට හේතුවේ. නූතනයෙහි භික්ෂු ජීවිතයේ පවතින කාර්යබහුලත්වය නිසා වෙන් ම භික්ෂුවගෙන් වත්පිළිවෙත් කෙමෙන් ඈත් වීමට පටන් ගෙන ඇති බව පෙනේ. කෙසේ වෙතත් ආරාමික ජීවිතයෙහි යහපැවැත්මට වත්පිළිවෙත් මහෝපකාරී වේ.

## නිගමනය

විනයෙන් තොර වූ භික්ෂු සමාජයක් නොපවතින්නා සේම වත්පිළිවෙතින් තොර භික්ෂු සමාජයක් ද නොපවතී. ආරාමික ජීවිතයේ සුහදත්වය, සහෝදරත්වය හා කළමනාකාරිත්වය රඳා පවතින්නේ ආරාමික වත්පිළිවෙත්හි පවතින සුභවාදී වූ නිර්දේශයන් එකිනෙකා අවබෝධ කරගැනීම තුළිනි. බුද්ධ ධර්මාන සමයේ සිට වර්තමානය දක්වා භික්ෂු සමාජය සමාජ ස්ථරයක් ලෙසින් නොබිඳී පවතින්නට හේතු වූයේ මෙම ශික්ෂණ සමුදාය හඳුනාගෙන ඒ තුළ නිරත වූ නිසාවෙනි. එහෙයින් නූතන භික්ෂු සමාජයේ යහපැවැත්ම උදෙසා ද චුල්ලවග්ගපාළියෙහි නිර්දේශිත ආරාමික වත්පිළිවෙත් මහෝපකාරී වේ. මෙම පර්යේෂණය සාක්ෂාත්කරණය උදෙසා මෙහිදී භික්ෂු සමාජය, බෞද්ධ වත්පිළිවෙත්, චුල්ලවග්ගපාළි වත්තක්ඛන්ධකය, බෞද්ධ භික්ෂු සමාජයේ ආරාමික වත්පිළිවෙත්, නූතන භික්ෂු සමාජය හා ආරාමික වත්පිළිවෙත් යන ප්‍රස්තුත සාකච්ඡා විය. වත්පිළිවෙතින් තොර භික්ෂු සමාජයේ යහපැවැත්මක් හා චිර පැවැත්මක් නොවනු ඇත.

## ආන්තික සටහන්

1 "සංඝීචෙව ගණීච ගණාචරියොච......." *දී.නි. I*, සාමඤ්ඤඵල සූත්‍රය, 32 පිට.

2 "අථඛො ආයස්මා අඤ්ඤාකොණ්ඩඤ්ඤො දිට්ඨධම්මො පත්තධම්මො විදිතධම්මො පරියොගාළ්හ ධම්මොතිණ්ණ විචිකිච්ඡෝ විගත කථංකථො වෙසාරජ්ජපත්තිතො අපරප්පච්ච සත්ථු සාසනේ භගවන්තං එතදවොච ලභෙය්‍ය'හං භන්තේ භගවතෝ සාන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍ය උපසම්පදන්ති" *මහාවග්ගපාළි I*, මහාඛන්ධක - 26 පිට.

3 ලාභෙය්‍යා'හං භන්තේ, භගවතෝ සන්තිකේ පබ්බජ්ජං ලභෙය්‍ය උපසම්පදන්ති - ඛුද්දක නිකාය, සුත්ත නිපාත, පබ්බජ්ජා සූත්‍රය -26 පිට.

4 "අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤෝ, අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො'ති ඉතිහිදං ආයස්මන්තෝ 7කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤත්' වෙව නාමං අහෝසි". *මහාවග්ග පාළි* I - 24 පිට.

5 අථ ඛො ආයස්මතො ච වප්පස්ස ආයස්මතෝ ච භද්දියස්ස භගවතා ධම්මියා කථාය ඔවදියමානානං අනුසාසියමානානං විරජං විතමලං ධම්මචක්ඛුං උදපාදි.- එම - තෙන ඛො පන සමයෙන ඡ ලොකෙ අරහන්තො හොන්ති - එම- 30 පිට.

7 චරථ භික්ඛවේ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං මා එකෙන ද්වෙ අගමිත්ථ. දෙසෙථ භික්ඛවේ ධම්මං ආදි කල්‍යාණං සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙථ. -එම- 42 පිට.

8 තෙන ඛො පන සමයෙන භික්ඛු නානාදිසා නා නා ජනපදා පබ්බජ්ජාපෙඛෙ ආනෙන්ති භගවා තෙ පබ්බාජෙස්සති උපසම්පාදෙස්සතී' ති.එම -44 පිට.

9 තුම්හෙ'ව දානි භික්ඛවෙ තාසු තාසු දිසාසු තෙසු ජනපදෙසු පබ්බාජෙථ උපසම්පාදෙථා'ති. -එම-

10 බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1960, *පාලි - සිංහල අකාරාදිය*, ගුණසේන සහ සමාගම කොළඹ,429 පිට.

11 සුමංගල හිමි මඩිතියවෙල, 2011, *පාලි -සිංහල ශබ්දකෝෂය*, මහාබෝධි සමාගම, මරදාන,440 පිට.

12 ජයවර්ධන සෝමපාල, 1997, *සිංහල ඉංග්‍රීසි ශබ්ද කෝෂය*, ගොඩගේ සහ සහෝදරයෝ, ,මරදාන, 440 පිට.

13 *චුල්ලවග්ගපාළි,* වත්තක්ඛන්ධකය, 358 පිට.

14 එම -350 පිට.

15 *දීඝනිකාය*, සාමඤ්ඤඵල සූත්‍රය, 110 පිට.

16 *සුත්ත නිපාත*, කිංසීල සූත්‍රය, 98 පිට.

17 *සිංහල විශ්වකෝෂය -II,* 1965, රජයේ මුද්‍රණාලය, 606 පිට.

18 *මනෝරථපූරණී*, 657 පිට.

19 *මහාවග්ගපාළි*, 18 පිට.

20 *චුල්ලවග්ගපාළි,* වත්තක්ඛන්ධකය, 334 පිට.

21 -එම- 342 පිට.

22 -එම- 345 පිට.

23 -එම- 246 පිට.

24 -එම-

25 එම- 350 පිට.

26 -එම- 352 පිට.

27 -එම- 360 පිට.

28 -එම- 365 පිට.

29 -එම- 368 පිට.

30 -එම- 374 පිට.

31 -එම- 376 පිට.

32 -එම- 388 පිට.

33 -එම- 379 පිට.

34 - එම -

35 "දුක්ඛතරා පබ්බජ්ජා අසිධාරාය චංකමන සදිසා-" *ඛුද්දක නිකාය*, සුත්ත නිපාත, පබ්බජ්ජා සූත්‍රය, 122 පිට.

36 සම්බාධො' යංඝරාවාසො-රජස්සායතනං ඉති, බ්භොකාසො'ව පබ්බජ්ජා-ඉති දිස්වාන පබ්බජි.

37 *ඛු.නි., සු.නි.*, පබ්බජ්ජා සූත්‍රය, 122 පිට

38 තස්මාහි වත්තං පූරෙය්‍ය - ජින පුත්තෝ විචක්ඛණො,
ඔවාද බුද්ධ සෙට්ඨස්ස - තතො නිබ්බානමෙහී'ති.
*චුල්ලවග්ග පාළි*, වත්තක්ඛන්ධකය, 422 පිට.

## ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය

*ඛුද්දක නිකාය*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (පුනර්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004.

*චුල්ලවග්ගපාළි*, බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (පුනර්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004.

*දීඝනිකාය*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (පුනර්), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004.

*මහාවග්ග පාළි*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා, (පුනර්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004.

*සුත්තනිපාත*, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා (පුනර්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2004.

### ද්විතීයික මූලාශ්‍රය

ජයවර්ධන සෝමපාල, 1997, *සිංහල ඉංග්‍රීසි ශබ්දකෝෂය*, ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, 1960, *පාලි-සිංහල අකාරාදිය*, ගුණසේන සහ සමාගම, කොළඹ.

සුමංගල හිමි, මඩිතියවෙල, 2011, *පාළි- සිංහල ශබ්දකෝෂය*, මහාබෝධි සමාගම, මරදාන.